C
491.37
VIJ

දර්ශනශූරී උපාධිය (පාලි භාෂාව පිළිබඳ) සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට
ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධය

# මධ්‍යකාලීන ලාංකේය පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය : රූපසිද්ධි හා පයෝගසිද්ධි පිළිබඳ ඓතිහාසික හා තුලනාත්මක අධ්‍යයනයක්

# Pali Grammatical Traditions in Medieval Sri Lanka: A Historical and Comparative Study of the Rūpasiddhi and the Payogasiddhi

**මැදගම්පිටියේ විජිතධම්ම හිමි**

**දර්ශනශූරී උපාධිය (පාලි භාෂාව)**
**පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය**
**ශාස්ත්‍ර පීඨය**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**ශ්‍රී ලංකාව.**
**2009**

PERADENIYA
21 JUN 2010
LIBRARY

638035

# සාරාංශය

## මධ්‍යකාලීන ලාංකේය පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය: රූපසිද්ධි හා පයෝගසිද්ධි පිළිබඳ ඓතිහාසික හා තුලනාත්මක අධ්‍යයනයක්


මෙම පර්යේෂණය ලාංකේය ඉතිහාසයේ මධ්‍යතන යුගයට අයත් සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය මත පදනම් වූවකි. වෙසෙසින්ම මෙය කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායට අයත් රූපසිද්ධිය හා මොග්ගල්ලායන සම්ප්‍රදායට අයත් පයෝගසිද්ධිය පිළිබඳ ඓතිහාසික හා තුලනාත්මක අධ්‍යයනයකි.

එය සිදුකරන ලද්දේ පරිච්ඡේද පසකිනි. සෑම පරිච්ඡේදයකම උප බෙදීම් ඒකක නමින් හඳුන්වා ඇත.

පළමු පරිච්ඡේදයෙහි පාලි භාෂාවේ භාෂාමය හා ව්‍යාකරණ සම්ප්‍රදායමය පසුබිම විමර්ශනය කෙරෙයි. එහි ඒකක සයකි. ඉන් පළමුවැන්න පාලි භාෂාව පිළිබඳ වාග්විද්‍යාත්මක හැඳින්වීමකි. එමෙන්ම පාලියේ ඓතිහාසික සංවර්ධනය පිළිබඳ ශබ්ද විචාරාත්මක හා පදවිචාරාත්මක විමර්ශනයකි. දෙවැනි ඒකකය පාලි භාෂාව හා ව්‍යාකරණය පිළිබඳ මතවාද විමර්ශනයකි. මධ්‍යතන අවධිය දක්වා පාලි ව්‍යාකරණ අධ්‍යයනයේ ස්වරූපය හා පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය පිළිබඳ සාකච්ඡාවක් තෙවැනි හා සිව්වැනි ඒකකයන්ට ඇතුළත්ය. පස්වැනි සවැනි ඒකක අදාළ ග්‍රන්ථ දෙකෙහි මූලික තොරතුරු විමර්ශනයන්ය.

දෙවැනි පරිච්ඡේදයේ ඇතුළත් වන්නේ රූපසිද්ධි-පයෝගසිද්ධි ග්‍රන්ථ දෙකෙහි පාරිභාෂික ශබ්දමාලා සන්සන්දනයකි. මෙම පරිච්ඡේදයේ ඒකක බෙදා ඇත්තේ වාග්විද්‍යාත්මක කරුණු පදනම් කරගෙනය.

මෙම පර්යේෂණයේ කුඩාම පරිච්ඡේදය තෙවැන්නයි. එහි සාකච්ඡාවන්නේ මෙම ග්‍රන්ථ දෙකෙහි ශිල්පක්‍රමයන්ය.

අවසන් පරිච්ඡේද දෙක මෙම පර්යේෂණයේ වැදගත් පරිච්ඡේද වෙයි. ඒවා උක්ත ග්‍රන්ථ දෙකෙහි ව්‍යාකරණ ලක්‍ෂණ පිළිබඳ තුලනාත්මක විමර්ශනයන්ය. ඒ අනුව සිව්වැනි පරිච්ඡේදයේ දී අක්‍ෂරමාලාව, සන්ධි, නාම, කාරක, සමාස, තද්ධිත යන ව්‍යාකරණ ලක්‍ෂණ විමසා ඇත. පස්වැනි පර්ච්ඡේදයේ දී ධාතූන් ආශ්‍රයෙන් තැනෙන ව්‍යාකරණ පද වන ආඛ්‍යාත, කිතක දෙක විමසා බැලෙයි. එම පස්වැනි පරිච්ඡේදය කෙළවර ව්‍යාකරණ ලක්‍ෂණ තුලනයෙන් සාධනය වූ විශේෂ කරුණු දක්වා ඇත. අවසානයේ පර්යේෂණයේ සමාලෝචනය හා නිගමනය දක්වා ඇත.